JMC vLearning
"your virtual learning partner"

# LKAS 01 : මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**AAT අදියර III**

FAR - මූල්‍ය වාර්තාකරණය


සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

FARPack03

1

Sandeepa Jayasekera - JMC

# AAT තෙවනි අදියර මූල්‍ය වාර්තාකරණය

SRI LANKA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972


Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

# ගිණුම්කරණ ප්‍රමිත
# Accounting Standards

# මොකද්ද ගිණුම්කරණ ප්‍රමිතයක් කියන්නේ?



# ව්‍යාපාර ආයතන වල මූල්‍ය ප්‍රකාශ

| | |
|---|---|
| පිළියෙළ කිරීමේදී | ඉදිරිපත් කිරීමේදී |
| ඒකාකාරීබව ⇧ | ගුණාත්මකභාවය ⇧ |

වරලත් ගණකාධිකාරී ආයතනය ප්‍රකාශිත

මගපෙන්වීම් මාලාව

# ප්‍රමිත ඇති කිරීමට හේතු

සංසන්දනාත්මක බව ⇧

හෙළිදරව් කිරීම්වල අර්ථාන්විත බව ⇧

මූල්‍ය වාර්තා භාවිතා කරන අයට උපකාරී වීම

මූල්‍ය වාර්තා පිළියෙළ කරන අයට උපකාරී වීම

1995 අංක 15 දරණ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත අනුව විශේෂිත ව්‍යාපාර සංවිධාන සඳහා ප්‍රමිත නෛතික අවශ්‍යතාවයකි.

- බැංකු
- රක්ෂණ ආයතන
- ණය සාධකකරණ ආයතන
- මූල්‍ය ආයතන
- ඒකකභාර
- අරමුදල් කළමනාකරණ ආයතන
- කොටස් තැරැව්කාර ආයතන
- කොටස් වෙළඳපොල
- ලැයිස්තුගත සමාගම්
- ආදායම රු. මිලියන 500 ට වැඩි සමාගම්
- ප්‍රාග්ධනය රු. මිලියන 100 ට වැඩි සමාගම්
- මුළු වත්කම රු.මිලියන 300 ට වැඩි ආයතන
- බැංකු ණය රු. මිලියන 100 ට වැඩි සමාගම්
- භාණ්ඩ සේවා විකිණීමේ නියුතු රාජ්‍ය සංස්ථා

ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය වාර්තා පිළියෙල නොකරන විශේෂිත ව්‍යාපාර සංවිධාන අධ්‍යක්‍ෂවරුන්

| | | |
|---|---|---|
| රු. ලක්‍ෂ 500,000 නොවැඩි දඩ මුදලක් | හෝ | අවුරුදු 5 කට නොවැඩි සිරගත කිරීමකට ලක්කළ හැකිය |

# aat තෙවන අදියරට අදාළ ගිණුම්කරණ ප්‍රමිත

1. LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
2. LKAS 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි
3. LKAS 10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්
4. LKAS 12 ආදායම් බදු
5. LKAS 16 දේපල, පිරියත සහ උපකරණ
6. LKAS 19 සේවක ප්‍රතිලාභ
7. LKAS 36 වත්කම් හානිකරණය
8. LKAS 23 ණයගැනීමේ පිරිවැය
9. LKAS 37 වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්
10. LKAS 38 අස්පෘශ්‍ය වත්කම්
11. SLFRS 15 ගණුදෙණුකරුවන් සමඟ ගිවිසුම්වලින් වන අයභාරය
12. SLFRS 16 කල්බදු
13. මූල්‍ය සාධන පත්‍ර පිළිබඳ මූලික අවබෝධය
14. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතන සඳහා වූ ප්‍රමිත පිළිබඳ මූලික අවබෝධය

# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

# LKAS 01 – Presentation of Financial Statements

## මූල්‍ය ප්‍රකාශනවල පරමාර්ථය

ව්‍යාපාරයක් කෙරේ ඇල්මක් දක්වන පාර්ශවයන්ට ආර්ථික තීරණ ගැනීමට අවශ්‍ය මූල්‍ය තොරතුරු සම්පාදනය කිරීම.

### මූල්‍ය ප්‍රකාශන සංරචක

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** – වාර්තාකරණ දිනයට මූල්‍ය තත්වය (අභ්‍යන්තරව සහ බාහිරව මූල්‍ය ජනනය වූ ආකාරය සහ වත්කම් තුල ආයෝජනය වූ ආකාරය)
- **ලාභාලාභ ගිණුම සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය** – වාර්තාකරණ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රගතිය (ආදායම් සහ වියදම් අතර වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායම්)
- **ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය** – ව්‍යාපාරය සහ හිමිකරුවන් සමඟ වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල සිදු වූ ගණුදෙනු
- **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** – වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල මුදල්, මුදල් සමාන දෑ මෙහෙයුම් ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙසින් ව්‍යාපාරයට ගලා ආ සහ ගලා ගිය ආකාරය
- **සටහන් සහ වෙනත් හෙළිදරව් කිරීම්** – අනිකුත් මූල්‍ය ප්‍රකාශ තුලින් ලබාදිය නොහැකි වූ අතිරේකව වැදගත් වන තොරතුරු

# වෙනත් විස්තීරණ ආදායම්

ලාභය හෝ අලාභය තුල ඇතුලත් නොකළ මෙහෙයුම් නොවන අනෙකුත් ආදායම් වියදම් වෙනත් විස්තීරණ ආදායම් තුලට පහත දෑ ඇතුලත් වේ.

- LKAS 16 සහ LKAS 38 තුලින් පැන නගින ප්‍රත්‍යාගණන ලාභ/අලාභ
- LKAS 19 තුලින් පැන නගින, නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල ආයු ගණක ලාභ/අලාභ
- LKAS 21 විදේශ විනිමය ප්‍රමිතයට අනුව විදේශ මෙහෙයුමකට මූල්‍ය ප්‍රකාශ පරිවර්තනය කිරීමෙන් පැන නගින නීතිමය ලාභ/අලාභ
- SLFRS 09 මූල්‍ය සාධක වන ප්‍රමිතියේ වෙනත් විස්තීරණ ආදායම මගන් සාධාරණ අගය මනින උපකරණවල ලාභ අලාභ
- අරමුදල් ප්‍රවාහ ඉදිරි රැකුම මගින් පැන නගින ලාභ/අලාභ

## මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී වැදගත් වන දෑ

**සාධාරණ ඉදිරිපත් කිරීම**

මූල්‍ය ප්‍රකාශ තුලින් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය ප්‍රගතිය සත්‍ය සහ සාධාරණ ලෙස නිරූපණය විය යුතු වේ.

**ප්‍රමිත සමඟ අනුකූලතාවය**

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම ගිණුම්කරණ ප්‍රමිත අනුව සිදු කළ යුතු අතර ඒ බව මූල්‍ය වාර්තා තුල හෙළිදරව් කළ යුතු වේ.

**හිලව් කිරීම**

ගිණුම්කරණ ප්‍රමිතයකින් අවසර නොමැති විටක වත්කම්, වගකීම හෝ ආදායම් වියදම් එකිනෙක හා හිළව් නොකළ යුතුය.

**ප්‍රමාණාත්මක බව හා සමාහරණය**

එක හා සමාන ප්‍රමාණාත්මකභාවයෙන් යුතු අයිතම එකට නිරූපණය කළ යුතුය. ප්‍රමාණාත්මක නොවන අයිතම ඒවායේ ස්වාභාවය හෝ කාර්යය මත පොදුවේ සමාන අයිතම සමඟ එකට දැක්විය යුතුය.

## මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී වැදගත් වන දෑ

### වාර්තාකරණ කාලපරිච්ඡේදය

සාමාන්‍යයෙන් මූල්‍ය වර්ෂයක් සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබයි. යම් හෙයකින් කාලපරිච්ඡේදය වර්ෂයකට අඩු හෝ වැඩි වන්නේ නම්,

- එයට හේතුව
- මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර ඇති වටිනාකම් සම්පූර්ණ සංසන්දනාත්මක නොවන බව හෙළිදරව් කළ යුතුය.

### ඉදිරිපත් කිරීමේ සංගතතාවය

මූල්‍ය ප්‍රකාශන තුල අයිතමයන් ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණයන් ඒකාකාරීව පවත්වා සංගතතාවයයි. පහත අවස්ථා වලදී සංගතතාවයෙන් බැහැර විය හැක.

- LKAS 08 ප්‍රමිතයට අනුව තොරතුරු පමණක් විශ්වාසනීයව සහ අර්ථාන්විතව ඉදිරිපත් කිරිම අවශ්‍ය වූ විට ප්‍රතිපත්තීන් ස්වේච්ඡාවෙන් වෙනස් කළ හැකි
- ප්‍රමිතයක අවශ්‍යතාවක් මත ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරිමට අවශ්‍ය වූ විට

### සංසන්දනාත්මක තොරතුරු

ප්‍රමිතියකින් අවසර දීමකින් හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කරන සෑම වටිනාකමකටම සංසන්දනාත්මක තොරතුරු (පෙර වර්ෂය) ඉදිරිපත් කළ යුතු වේ.

# මූල්‍ය ප්‍රකාශන අන්තර්ගතය

## මූල්‍ය ප්‍රකාශන තුළ අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු කරුණු

- ව්‍යාපාරයේ නම
- මූල්‍ය ප්‍රකාශ අදාල වන්නේ සමාගමටද, සමූහයටද යන වග
- වාර්තාකරණ කාලපරිච්ඡේදය
- ව්‍යවහාර මුදල් ඒකකය
- මූල්‍ය ප්‍රකාශන අගයන්ගේ නිර්වද්‍යතා මට්ටම (රු. , රු. දහස්, රු. මිලියන)

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුහුණතේ ඉදිරිපත් කළ යුතු කරුණු

- දේපළ, පිරියත, උපකරණ
- ආයෝජන දේපළ
- අස්පෘශ්‍ය වත්කම්
- මූල්‍ය වත්කම්
- ජීව විද්‍යාත්මක වත්කම්
- තොගය
- වෙළඳ ලැබිය යුතු දෑ
- වෙළඳ ගෙවිය යුතු දෑ
- ප්‍රතිපාදන
- මූල්‍ය වත්කම්
- විකිණීම සඳහා තබා තිබෙන වත්කම්
- විකිණීම සඳහා තබා තිබෙන බැරකම්
- කොටස් ප්‍රාග්ධනය සඳහා සංචිත

# ජංගම/ජංගම නොවන වෙනස

සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුල හෝ වාර්තාකරණ දිනයේ සිට මාස 12 ක් තුල උපලබ්ධි මත වත්කම් හෝ නිරාකරණය මත වගකීම්

ඊට වැඩි කාලයක් ගත වේ නම්

**ජංගම**

**ජංගම නොවන**

# ලාභාලාභ ගිණුම සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මුහුණතේ ඉදිරිපත් කළ යුතු කරුණු

- අයභාරය
- මූල්‍ය පිරිවැය
- ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කළ ආශ්‍රිත සමාගම් හෝ බද්ධ ව්‍යාපාරවල ලාභ කොටස.
- බදු වියදම
- කාලපරිච්ඡේදයේ ලාභයෙන් මව් සමාගමට සහ පාලනයට යටත් නොවන අයිතියට අදාළ කොටස කාලපරිච්ඡේදයෙන් මුළු විස්තීරණ ආදායමින් මව් සමාගමට සහ පාලනයට යටත් නොවන අයිතියට අදාල කොටස.
- වෙනත් විස්තීරණ ආදායම් යනු උපලබ්ධි වූ ලාභ සහ මෙහෙයුම් ලාභ හැර වෙනත් ලාභ අලාභ මත හිමිකමට ඇතිවන බලපෑම වාර්තා කිරීම සඳහා භාවිතා කරන ප්‍රකාශනයයි. මෙහි ඉදිරිපත් කරන කරුණු තුලට

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ මුහුණතේ ඉදිරිපත් කළ යුතු කරුණු

- කාලච්ඡේදයේ මුළු ලාභාලාභය
- කාලච්ඡේදයේ වෙනත් විස්තීරණ ආදායම්
- ලාභාංශ
- කොටස් නිකුතු
- LKAS 08 ප්‍රමිතය යටතේ එන අතීතානුයෝගී භාවිතයෙන් සහ අතීතානුයෝගී නැවත ව්‍යවහාරයන්

## සටහන් සහ හෙළිදරව් කිරීම් තුල ඇතුලත් වන දෑ

- ගිණුම්කරණ ප්‍රතිපත්තීන්
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ බවට සටහනක්
- අනිකුත් මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කළ කරුණු වලට අදාල අතිරේක තොරතුරු
- අසම්භාව්‍ය වගකීම්
- වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්
- මූල්‍යමය නොවන හෙළිදරව් කිරීම්
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මිණුම්කරණ පදනම